# SLLA NEWSLETTER

VOLUME 34 | NUMBER 02 | October - December 2017 | ISSN 1391-2531

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෙනුවෙන් පැවැත්වූ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය වෙනුවෙන් 2017.11.28 දින ජාතික රූපවාහිනි සේවයේ 'සංහිඳ' වැඩසටහනෙහි සම්මුඛ සාකාච්ඡාවක් පැවත්විණි.. ඒ සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිනි යාපනය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනි ශ්‍රීකාන්තලක්ෂ්මී අරුලානන්දන් මහත්මිය සහ තෝරාගත් සභාපතිනි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනි ආචාර්ය නයනා විජයසුන්දර මහත්මිය සහභාගි වූහ.





එහිදී ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ කාර්යභාරය, ඉදිරි ඉලක්ක, සහ ජනතාවගේ කියවීම් රුචිය හා නව ප්‍රවණතා පිළිබඳ සාකච්ජා විය. මෙම වැඩසටහන මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ එහි කාර්යයන් පිළිබඳ ප්‍රචාරයක් ලබාදීමට හැකිවූ අතර, ඒ පිළිබඳව ජාතික රූපවාහිනි සේවයට අපගේ කෘතඥතාව පිරිනැමේ. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ මහජන සම්බන්ධතා නිළධාරිනී කේ. එන්. සමන්ති මෙනවිය මෙය සම්බන්ධීකරනය කරන ලදී.

**GROUP ACTIVITY**

## Workshop on "Abstract and Article Reviewing"

One day workshop on ***"Abstract and Article Reviewing"*** was successfully organized by the Convener Dr. (Ms.) Champa Alahakoon of Academic Libraries Group (2017/2018) of the Sri Lanka Library Association on 30th November 2017, at the OPA Centre, Colombo 07. Emeritus Prof. Jayadewa Uyangoda, University of Colombo and Dr. (Mrs.) Pradeepa Wijetunge, Librarian, University of Colombo served as the resource persons and twenty five librarians participated.













**IN THIS ISSUE**


| | | | | | |
|---|---|---|---|---|---|
| Group Activity | 01 | SLLA Council & Executive Committee Members | 02 | News | 01, 02, 03, 04 |
| Announcements | 04 | SLLA Strategic Plan | 05-08 | | |


*Sri Lanka Library Association, Organisation of Professional Associations, Sri Lanka, 275/75, Stanely Wijesundara Mawatha, Colombo 07, Sri Lanka, Tel/Fax: ++94-11-2589103, Email: slla@sltnet.lk*

**The SLLA Newsletter is published quarterly by the Sri Lanka Library Association.**

**An e-copy of this Newsletter is available at http://www.slla.org.lk/**

## SLLA COUNCIL MEMBERS 2017/2018.

**President:** Mrs. S. Arulanantham*
**President Elect:** Dr. (Mrs.) N.D. Wijayasundara*
**Immediate Past President:** Dr. (Mrs.) P. Wijetunge*
**Vice President:** Dr. R.C.G. Gamage*
**General Secretary:** Ms. L. Amerasekera*
**Asst. General Secretary:** Mrs. I.M. Katipearachchi*
**Treasurer:** Mr. A. D. Nallathamby*
**Education Officer:** Mrs. K.R.N. Harshani*
**Asst. Education Officer:** Mr. K.G.S. Gunathilake*
**Publications Officer:** Mrs. N. D. Peiris*
**Information & Public Relations Officer:**
Ms. K.N.Samanthi*

**Nominated Members for Council:**
Dr. (Mrs.) W. Seneviratne
Mr. P.B. Gallaba

**Conveners of the Professional Groups:**
**Academic Libraries:** Dr. (Ms.) C.N.K. Alahakoon
**Government Libraries:** Ms. Urika Munasinghe
**National Library:** Mr. U. Amarasiri
**Public Libraries:** Mrs. V. Gangabadaarachchi
**School Libraries:** Mrs. Y. Geeganagamage
**Special Libraries:** Ms. S. Weerakoon
**NACLIS Group:** Dr. (Mrs.) N.D. Wijayasundara

*** Executive Committee Members**

**Nominated Members for Executive Committee:**
Mrs. D. Warnasuriya*
Mrs. S. Weerasinghe*

## SLLA Open Day for DIPLIS Programe

SLLA open day was held on 19November 2017at Sri Lanka Library Association. Students who participated in the event along with their parents got a deep understanding of the DIPLIS programme. Dr (Mrs.) Nayana Wijayasundara (President Elect.) Ms. Lilamani Amarasekera (General Secretary) Mrs.K.R.N.Harshani (Education Officer), Mr. Sugath Gunathilake (Assistant Education Officer) K.N.Samanthi (Information & Public Relation Officer) represented SLLA.






Ms.Wathsala Kodithuwakku and Ms, K.N.Samanthi shared their career path and experience with the gathering in this course. Interviews were held to enroll student for the 2018 academic year on the same day.

## National Reading Month Walk By NLDSB on 2nd October 2017




## ආචාර්ය රිචඩ් පතිරණ පුස්තකාලයේ කියවීමේ කඳවුර

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන් සාහිත්‍ය මාසය සහ ජාතික කියවීමේ මාසය නිමිත්තෙන් 2017.09.29 වන දින ආචාර්ය රිචඩ් පතිරණ පුස්තකාලයේ කියවීමේ කඳවුරක් පවත්වන ලදී.






## Revision Seminar for Open / Limited Competitive Examination for the Recruitment of Government Librarians (Grade III) 2017

Sri Lanka Library Association organized a two days revision seminar for ***"Open/Limited Competitive Examination for the Recruitment of Government Librarians (Grade III) 2017"*** on 18th and 19th November 2017, at the National Library and Documentation Board. The Seminar covered four main themes, Libraries and Librarianship, Organization of Information & Knowledge, Information Communication Technology and Library Resources and Information Services. Mr. Ananda Tissa, Mr.G.R. Padmasiri, Dr. Ruwan Gamage and Mr. Uditha Alahakon served as resource persons. This revision seminar was coordinated by Mrs. K.R.N. Harshani, Education Officer, SLLA (2017/2018).








## Colombo Center Visit



SLLA Council Members Srikanthaluxmy Arulalantham (President), Mrs. K.R.N. Harshani (Education Officer), Mr. Sugath Gunathilake (Assistant Education Officer) and Mr. Jagath Wedasinghe (Colombo Centre Coordinator) visited the Colombo Centre on 22nd October 2017. The main aim of this visit was to meet the students who are following the Diploma in Library & Information Science (DIPLIS) offered by SLLA and also the teaching staff of the DIPLIS course in the Colombo Centre. This is the second visit made by the office bearers to identify the problems faced by the students and lecturers with regard to infra-structure facilities, problems regarding teaching and learning activities. Discussions with students and staff were held separately and there was active participation by both students and teaching staff.





# ANNOUNCEMENTS

**Deadline extended till 28th February 2017**

**Sri Lanka Library Review**

The Publication Committee wishes to receive articles from the members, to be published in the next issue in June 2018. Articles will be accepted till ~~31st of January 2018~~. Please follow the SLLA website (http://www.slla.org.lk) for guidelines on submitting articles. You may submit articles written in Sinhala, Tamil or English. Please send in your manuscript to the Publication Officer (pubofficer.slla1617@gmail.com) in electronic format.

## Make it happen: Transformation of library services for next generation
## NACLIS 2018
## Call for Papers - First Announcement

National Conference on Library and Information Science 2018 (NACLIS 2018) will be held on 28th June 2018 in Colombo. This conference is organized by the Sri Lanka Library Association.

Theme of the conference is **"Make it happen: Transformation of library services for next generation"**. The conference will focus on hot issues and topics, the latest research achievements, innovative ideas, advanced technology and latest developments related to the theme. To ensure the academic quality of this conference and attract more paper submissions, professionals and researchers of library and information science are invited to submit papers and attend the conference.

**Submission of Paper**

NACLIS 2018 accepts both full papers and abstracts. We accept manuscripts written in English, Sinhala and Tamil. Those who wish to submit their articles in Sinhala or Tamil, should attach a separate abstract in English. All the articles should be sent to Convener of NACLIS through email *(nayanaw@sjp.ac.lk).*

Contributors should adhere to the guidelines appearing on the website to prepare their manuscripts
***http://www.slla.org.lk/index.php/261-call-for-papers-naclis-2018***

**Important Dates**

Deadline for Submission of full paper/ abstracts: 15th February, 2018
Notification of Acceptance: 31st March, 2018
Deadline to submit **camera ready full paper:** 30th April, 2018
Conference day: 28th June 2018

Dr. (Mrs.) Nayana Wijayasundara
Convener- NACLIS 2018

## IFLA/BSLA/SLLA වැඩසටහන යටතේ පුස්තකාල බලගැන්විමේ ප්‍රාදේශීය එක්දින වැඩමුළුව

IFLA/BSLA/SLLA වැඩසටහන යටතේ පුස්තකාල බලගැන්විමේ ප්‍රාදේශීය එක්දින වැඩමුළුව මධ්‍යම පළාතේ මහජන පුස්තකාලයාධිපතිවරුන් සඳහා 2017.12.19 දින වත්තේගම නගර ශාලාවේදී පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා පැවැත්විණි. මෙහි මූලික තේමාව වූයේ පුස්තකාලයාධිපතිවරුන් සඳහා විද්වත් වෘත්තීය ආචාරධර්ම පිළිබඳව කාර්යමූ, වැඩමුළුවක් පැවැත්වීමයි. මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකයින් වශයෙන් සහභාගී වූ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හිටපු සභාපතිවරයෙකු මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු ජේෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති අන්තර් ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ සම්බන්ධීකාරක නීතීඥ ජී. එම්. පී. ගල්ලබ මහත්මා සහ කැළණිය විශ්වවිද්‍යා,යේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය මහත්මා යන දෙපල විසින් **"පුස්තකාලයාධිපතිවරුන් සඳහා ආචාරධර්ම පද්ධතියක්"** සහ **"ආචාරධර්ම පිළිබඳ හැඳින්වීමක් : වෘත්තීය චර්යාව සහ ආචාරධර්ම සංග්‍රහය"** මැයෙන් දේශන පවත්වන ලදී. ආචාර්ය චම්පා එන්. කේ. අ,හකෝන් මෙනවිය විසින් **"තොරතුරු බෙදා හැරීමේ නීතිමය වගකීම් සහ ආචාරධර්ම"** පිළිබඳ දේශනක් පවත්වන ලදී. වත්තේගම මහජන පුස්තකාලයාධිපති එච්. එම්. ටී. හේරත් මහත්මා සහ පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මාරස්සන මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපති ධම්මික වීරකෝන් මහත්මා විසින් මධ්‍යම පළාතේ වැඩමුළුව සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ඒ සඳහා මහජන පුස්තකාලයාධිපතිවරුන් 35 දෙනෙක් ද ප්‍රජා සංවර්ධන නිළධාරීන් දෙදෙනෙක් ද සහභාගී වූහ.

මෙම වැඩමුළුව සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් මහනුවර (මධ්‍යම), වත්තේගම නගර සභාවේ ලේකම් පී. එස්. බී. මඩුගල්ල මහත්මා මධ්‍යම පළාත් සභාවේ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිනි ජී. ජී. එල්. ජී. පෙරේරා මහත්මිය, ආරම්භක අවස්ථාවට සහභාගි වූ අතර මෙම වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙනු ලැබීය.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්මේ මුල් අදියර සාර්ථකයි



පද්මා බණ්ඩාරනායක මහත්මිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම උපායමාර්ගික සැලැස්මේ මුල් අදියර ක්‍රියාත්මක කරලීම පිළිබඳව, එහි විවිධ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරනු ලබන කමිටුවල කැඳවුම්කරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡාවකි. මෙහි දෙවන කොටස ඉදිරි කලාපයේ පළ කෙරේ.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම දියත් කොට මාස 18ක් ගතවන 2017 වසරේ අවසානය වන විට කමිටු 25ක් විසින් සැලැස්මේ ප්‍රධාන අංශ 6 තුළ දක්වා ඇති විවිධ මාදිලියේ ව්‍යාපෘති 40කට අධික ප්‍රමාණයක් ක්‍රියාත්මක කරලීම අරඹා ඇත. මෙම ව්‍යාපෘතිවල සාර්ථක අසාර්ථකභාවය ඇගයීමට තවමත් කාල වේලා මඳ වූවත්, මෙතරම් කමිටු සංඛ්‍යාවක් ආරම්භක අදියරේදීම විශාල ව්‍යාපෘති සංඛ්‍යාවක් දියත් කිරීම ම පැසසිය යුතු කරුණකි.

2015-2018 කාලය තුල ක්‍රියාත්මක වන ඇමරිකානු පුස්තකාල සංගමයේ (ALA) උපායමාර්ගික සැලැස්ම සැකසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේදී එහි සාමාජිකයන්ට සංගමයේ ඉදිරි ප්‍රගතිය පිළිබඳ ප්‍රශ්න 3ක් යොමු කළ බව එහි සඳහන් වේ. ඒවා නම්

(i) සාර්ථකත්වය යනු කුමක්ද? (What would success look like?)

(ii) ඔබ සිතන අන්දමට එම සාර්ථකත්වය කරා ළඟාවිය හැක්කේ කෙසේද? (How do you think we might get there?)

(iii) ඔබට/ඔබගේ කමිටුවට/ඔබගේ පුස්තකාල අංශයට ඒ සඳහා අපට සහාය විය හැකි ආකාරය කුමක්ද? (How might you/your committee/your library sector help us to get there?)

ඉහත තත්වයන් ඇමරිකානු පුස්තාකල සංගමයේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කරලීමට මෙන්ම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්ම සාර්ථක කර ගැනීමට ද පදනම බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත.

මෙහි දී අපගේ අරමුණ වූයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලීමේ ආරම්භක නියමුවන් ලෙස, එයට නායකත්වය ලබා දුන් කමිටුවල කැඳවුම්කරුවන් සමඟ අදාළ ව්‍යාපෘති හා ඒවායේ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීමයි. ඒ මගින් මේ පිළිබඳව වඩාත් පැහැදිලි, නිවැරදි චිත්‍රයක් සංගමයේ සාමාජිකයන් වෙත ලැබෙනු ඇත. එසේම මෙම ක්‍රියාකාරීන් දිරිමත් කරලීමත්, අගය කිරීමත් මෙයින් අපේක්ෂා කෙරේ. ඉදිරි කාලය තුළ මෙවැනි කැපවුණු වෘත්තිකයින් රැසකගේ සහාය උපායමාර්ගික සැලසුම් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය වේ. පුවත් හසුනේ ඇති සීමිත ඉඩ ප්‍රමාණය සලකා බලා ප්‍රධාන ප්‍රශ්න 3ක් කමිටු කැඳවුම්කරුවන් වෙත යොමු කෙරිණිත (i) ඔබ කමිටුව මෙම ව්‍යාපෘතිය/ව්‍යාපෘති තෝරා ගත්තේ ඇයි? (ii) එහි වර්තමාන ප්‍රගතිය කුමක්ද? සහ (iii) සංගමයේ උපායමාර්ගික සැලැස්ම පිළිබඳව ඔබගේ අදහස කුමක්ද? යන්න එම ප්‍රශ්න ත්‍රිත්වය වේ. මෙම ප්‍රශ්නවලට බොහෝ අවස්ථාවල දීර්ඝ පිළිතුරු ලැබුණද ඒවා මෙහිදී සංක්ෂිප්තව ඉදිරිපත් කෙරේ.

### පුස්තකාල සංගම් කාර්යාලය කාර්යක්ෂමව ක්‍රියාත්මකවීම සංගමයේ සාර්ථකත්වයේ පදනමයි.

පේරාදෙණිය සරසවියේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති හර්ෂානී දිසානායක මහත්මිය උපායමාර්ගික සැලැස්මේ පුස්තකාල සංගම් කාර්යාලය නවීකරණය කරලීමේ ව්‍යාපෘතියේ නියමුවා ලෙස කටයුතු කරයි.



මීට පෙර කාර්මික තාක්ෂණ ආයතනයේ සේවය කරන සමයේ එහි ISO 9001:2000 පුස්තකාල ප්‍රමිතිකරණ ව්‍යාපෘතියට සම්බන්ධවීමෙන් ලත් අත්දැකීම් මෙම ව්‍යාපෘතිය තෝරා ගැනීමට හේතු වූ බව ඇය සඳහන් කළාය. ඒ අනුව පුස්තකාල සංගම් කාර්යාලය උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කරන නවීන කාර්යාලයක් බවට පත් කිරීමේ මූලික කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. දැනට කාර්යාල කටයුතු පිළිබඳ නියමුවක් (Office Procedure) සකස් කෙරෙමින් පවතී. සංගමයේ කාර්යාලයට නව විධායක ශ්‍රේණියේ තනතුරක් ඇති කර ඇත. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු සැසි පවත්වා ඇත.

පුස්තකාල සංගම් කාර්යාලය, සංගමයේ සියලු කටයුතු මෙහෙයවන සහ සම්බන්ධීකරණය කෙරෙන ස්ථානය බැවින් එය නවීන කළමනාකරණ විධි අනුව මනාව පවත්වාගෙන යාම සාර්ථකත්වයේ පදනම බව දිසානායක මහත්මියගේ අදහස වේ. සංගමයේ කටයුතු වර්ධනය හා නවීකරණය සඳහා උපායමාර්ගික සැලැස්ම බෙහෙවින් ප්‍රයෝජනවත් බව ඇය සඳහන් කළාය.

### සංගමයේ සාර්ථක ඉදිරි ගමනකට උපාය මාර්ගික සැලැස්මක් අත්‍යාවශ්‍යයි.

ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන තොරතුරු නිලධාරී සහ එහි තොරතුරු සේවා අංශ ප්‍රධාන ලෙස සේවය කළ සුනේත්‍රා පෙරේරා මහත්මිය උපායමාර්ගික සැලැස්මේ යෝජිත, පුස්තකාල සංගමයේ ලේඛන ඩිජිටල්කරණ ව්‍යාපෘතිය භාරව කටයුතු කරයි. ජාතික විද්‍යා පදනමේ සේවය කරන සමයේ දිවයින පුරා විද්‍යා හා තාක්ෂණ පුස්තකාල ඩිජිටල්කරණ ව්‍යාපෘතිය භාරව කටයුතු කිරීමෙන් ලත් අත්දැකීම් මෙම ව්‍යාපෘතිය තෝරා ගැනීමට හේතුවී ඇත. සංගම් කාර්යාලයේ ඩිජිටල්කරණය කළ යුතු පාලක මණ්ඩල හා, විධායක කමිටු රැස්වීම් වාර්තා, පර්යේෂණ, NACLIS සම්මන්ත්‍රණ පත්‍රිකා ඇතුලු ලේඛන හඳුනා ගැනීමත්, ඩිජිටල්කරණ කටයුතු සඳහා අවශ්‍ය පසුබිම් කටයුතු සිදු කිරීමත් මෙහි මුල් පියවර ලෙස සිදු කර ඇත. මේ යටතේ 1985-2016 කාලයේ පාලක මණ්ඩල රැස්වීම් වාර්තා, විධායක කමිටු රැස්වීම් වාර්තා, අධ්‍යාපන සහ මුදල් කමිටු වාර්තා, සංගමයේ වාර්ෂික වාර්තා, විගණන වාර්තා, NACLIS proceedings සහ වාර සඟරාවේ ඇතැම් කලාප ඩිජිටල්කරණය අවසන් කර ඇත.



සංගමයේ ඉදිරි කටයුතු ක්‍රමානුකූලව සැලසුම් කිරීමටත්, පුස්තකාල ක්ෂේත්‍රයේත්, සංගමයේ සාමාජිකයින්ගේත් යහපත සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙලක් සහිත මෙබඳු උපායමාර්ගික සැලැස්මක වටිනාකම කියා නිම කළ නොහැකි බවත්, සංගමයේ සාමාජිකයින්ගේ හැකියාවලින් උපරිම ඵල නෙලා ගැනීමට මෙවැනි උපායමාර්ගික සැලැස්මක් වැදගත් බවත් පෙරේරා මහත්මිය සඳහන් කළාය.

*(Continued to page 06)*

*(Continued from page 05)*

**උපායමාර්ගික සැලැස්ම මඟින් සියලු දෙනාගේම ශක්තිය, සම්පත් සහ කාලය එකම දිශානතියකට, පොදු පිළිගත් වැඩ පිළිවෙළකට යොමු කරවනු ලබයි.**

පුස්තකාල සංගමයේ ප්‍රකාශන නිලධාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති නීතා පීරිස් මහත්මිය ඉෆ්ලා ආයතනය මඟින් ප්‍රකාශිත විද්වත් වර්තා 4ක් සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය භාරව කටයුතු කරයි. දේශීය භාෂාවලින් පුස්තකාල විද්‍යා ප්‍රකාශන හිඟවීමත්, ඒ හේතුවෙන් පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය හදාරන ශිෂ්‍යයනට මෙන්ම, පුස්තකාලයාධිපතීන්ට දුෂ්කරතා රැසකට මුහුණ පෑමට සිදු වී ඇති බවත්, එම තත්වයට යම් පිළියමක් ලෙස උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති ලෙස මෙම පරිවර්තන කාර්යයට මුලපිරූ බවත් පීරිස් මහත්මිය සඳහන් කළාය.



ඒ අනුව දුර්ලභ පොත් සහ අත් පිටපත් ඩිජිටල්කරණය, පාසල් පුස්තකාල සඳහා නියමු, අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ සුචිකරණය විෂයයන් පිළිබඳව ඉෆ්ලා ආයතනය මෑතකදී පළ කළ උසස් ප්‍රකාශන කිහිපයක් පරිවර්තනය කෙරේ. දැනට පරිවර්තන කටයුතුවලින් 80% ක ප්‍රමාණයක් අවසන් කර ඇත. උපායමාර්ගික සැලැස්ම මඟින් පුස්තකාල සංගමයට කෙටි කාලීන සහ දිගු කාලීන ඉලක්ක ලබා දී ඇති බවත්, එය දේශීය පුස්තකාල වෘත්තියට යහපත් මාර්ග සිතියමක් බවත්, සංගමයට වඩාත් ඵලදායී ලෙස කටයුතු කිරීමට එය පිටිවහලක් වන බවත්, එමඟින් අප සැමගේ ශක්තිය, කාලය සහ සම්පත් එක් දිශානතියකට යොමු කර ඇති බවත්, ඇය තව දුරටත් සඳහන් කළාය.

**පුස්තකාල විද්‍යා වෘත්තිය ශක්තිමත් වී සාමාජිකයින් අතර සහයෝගය වර්ධනය වේ.**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට අනුබද්ධව උසස් අධ්‍යාපන ආයතන රාශියක් තිබුණද බොහෝ අවස්ථාවල එම ආයතන අදාළ විශ්වවිද්‍යාල සමඟ ඇති සෘජු සම්බන්ධතාවය සීමිත බැවින්, ඒවාට සුවිශේෂී වූ ගැටලු පවතී. මේ ආයතන පුස්තකාල පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදු කොට ඒවා මඟින් වඩාත් පුළුල් සහ ඵලදායී සේවාවන් ලබා දීමට සහායවීමත්, එම ආයතන පුස්තකාල අතර සහයෝගය වර්ධනය කරලීමත් තම කමිටුවේ අරමුණ බව එහි කැඳවුම්කරු කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනි සුජීවා රත්නායක මහත්මිය සඳහන් කළාය.



ඒ අනුව උපායමාර්ගික සැලැස්ම පදනම් කරගෙන, (i) මෙම ආයතන පුස්තකාල සතුව ඇති සම්පත් හා සිදු කෙරෙන සේවා පිළිබඳ වෘත්තීය ප්‍රකාශනයක් පළ කිරීම (ii) එම ආයතනවල සේවාවන් හා අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම යන ව්‍යාපෘති කමිටුව විසින් දියත් කර ඇත. සංගමයේ උපායමාර්ගික සැලැස්ම මඟින් සෑම පුස්තකාල ක්ෂේත්‍රයක් පිළිබඳවම අවධානය යොමු කර තිබීමත්, ඒවා වැඩිදියුණු කිරීම සඳහා සහායවීමට අවස්ථාව ලබාදීමත් අගය කළ යුතු බව රත්නායක මහත්මිය සඳහන් කරයි. මේ මඟින් පුස්තකාල වෘත්තිය ශක්තිමත් කරලීමත්, පුස්තකාල වෘත්තිකයන් අතර සහයෝගය වර්ධනය කිරීමත් සිදු වන බව ඇයගේ අදහස විය.

**උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තැබූ අතිශය වැදගත් පියවරකි.**

ජාතියේ ප්‍රකාශනවල ග්‍රන්ථ විඥාපන පාලනය ජාතික වශයෙන් මෙන්ම අන්තර්ජාතිකවද සුවිශේෂ වැදගත්කමක් උසුලන බව ජාතියේ ප්‍රකාශනවල ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ විශේෂ කමිටුවේ සම කැඳවුම්කරු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ චන්දිමා වාදසිංහ මහත්මිය පවසයි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය මඟින් ආවරණය නොවන ශ්‍රී ලාංකික ප්‍රකාශන පිළිබඳව ගවේෂණයක් සිදු කිරීමත්, ඒවා විධිමත් ලෙස ආවරණය කිරීමට ගත යුතු පියවර පිළිබඳ නිර්දේශ සහිතව වාර්තාවක් ඉදිරිපත් කිරීමත් මෙම කමිටුවේ කාර්ය භාරය වේ. තමන් සහ තම කමිටුවේ සාමාජිකයින් සිය වෘත්තීය ජීවිතයේ සැලකිය යුතු කාලයක් ජාතික ග්‍රන්ථනාමාවලි සම්පාදන කාර්යයට සම්බන්ධවූ බැවින් මෙම ව්‍යාපෘතිය තෝරාගත් බව ඇය සඳහන් කළාය. මෙම විෂය පිළිබඳ පර්යේෂණ වාර්තා, විශේෂ අන්තර්ජාතික සමුළුවල නිර්දේශ, ඉෆ්ලා සංවිධානය මඟින් නිකුත් කර ඇති උපදෙස් හා නියමු, වෙනත් රටවල සාර්ථක ජාතික ග්‍රන්ථ විඥාපන පාලන කටයුතු පිළිබඳ අත් දැකීම් ද දැනට කමිටුව අධ්‍යයනය කරන බවත් ඒ අනුව ඉදිරි මාස කිහිපය තුළ තම ව්‍යාපෘති වාර්තාව සකස් කොට අවසාන කිරීමට බලාපොරොත්තු වන බවත්, වාදසිංහ මහත්මිය සඳහන් කළාය.



සිය ප්‍රථම උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය තැබූ අතිශය වැදගත් පියවරක් බවත්, දැනට දියත් කර ඇති ව්‍යාපෘතිවලින්ම පෙනී යන ආකාරයට මේ මඟින් රටේ සෑම පුස්තකාල ක්ෂේත්‍රයකටම පුළුල් වෘත්තීය දායකත්වයක් සැපයීමට සංගමයට අවස්ථාව ලැබෙන බවත්, ඇය ප්‍රකාශ කළාය.

*(Continued to page 07)*

*(Continued from page 06)*

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමය අන්තර්ජාතික මට්ටමට ඔසවා තැබීමකි.



උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කරලීම තුළින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, එයට අදාළ පාර්ලිමේන්තු පනත් මඟින් පැවරී තිබෙන සම්පූර්ණ වගකීම් හා කාර්ය භාරය ඉටු කිරීම නිශ්චිත ලෙසම ආරම්භ කර ඇති බවත්, මේ මඟින් සංගමය අන්තර්ජාතික මට්ටමට ඔසවා තබා ඇති බවත් කැලණිය විශ්වවිද්‍යාලයේ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ආර් ඩී ආනන්දතිස්ස මහතා සඳහන් කරයි. පුස්තකාල විද්‍යා අධ්‍යයන ආයතන අතර සහයෝගිතාව වර්ධනය කිරීම පිළිබඳ විශේෂ කමිටුවේ නායකත්වය උසුලන ආනන්දතිස්ස මහතා උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කරනු ලබයි.

(i) ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යයන ආයතනවල ප්‍රධාන පුස්තකාල විද්‍යා පාඨමාලා සඳහා පොදු නිර්නායක හා ප්‍රමිතීන් හඳුන්වාදීම (ii) ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා පාඨමාලා සඳහා අවශ්‍ය වන විෂය විශේෂඥතා ලැයිස්තුවක් සම්පාදනය සහ දැනට මෙම ආයතනවල පූර්ණකාලීනව හා අර්ධකාලීනව සේවය කරන ආචාර්ය මණ්ඩලවල සාමාජිකයන්ගේ විෂය විශේෂඥතා හඳුනා ගැනීම සහ (iii) ශ්‍රී ලංකාවේ පුස්තකාල විද්‍යා අධ්‍යයන ආයතන පසුගිය වසර 30 තුළ (1987-2017) සිදු කළ ශාස්ත්‍රීය හා පර්යේෂණාත්මක ලිපි අනුක්‍රමණිකාවක් සම්පාදනය කිරීම එම ව්‍යාපෘති වේ. දැනට මෙම ව්‍යාපෘතිවලට අදාළ මූලික සැලසුම් කටයුතු අවසන් කර ඇති අතර තොරතුරු මූලාශ්‍ර හා ප්‍රාථමික දත්ත හඳුනාගෙන ඇත. ඉදිරි මාස කිහිපය තුළ මෙම ව්‍යාපෘතීන් සාර්ථක ලෙස අවසන් කිරීමට තම කමිටුවට හැකිවනු ඇතැයි ආනන්දතිස්ස මහතා විශ්වාසය පළ කරන ලදී.

## උපායමාර්ගික සැලැස්ම මඟින් මිනිය හැකි ඉලක්ක ලබාදී තිබීම අගය කළ යුතුයි.

උපායමාර්ගික සැලැස්ම මඟින් සංගමයේ ඉදිරි කටයුතු පිළිබඳ මඟ පෙන්වීමක් මෙන්ම, මිනිය හැකි ඉලක්ක ලබා දී තිබීම අගය කළ යුතු බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනි චාමනී ගුණසේකර මහත්මිය ප්‍රකාශ කරයි. අධ්‍යයන පුස්තකාල ක්ෂේත්‍රයේ සේවය කරන පුස්තකාලයාධිපතීන් අතර ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සාමාජිකත්වය වර්ධනය කිරීම සහ අධ්‍යයන සහ විශේෂ පුස්තකාල ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) අවශ්‍යතා පිළිබඳව අධ්‍යයනය කිරීම යන ව්‍යාපෘති භාර කමිටුවල කැඳවුම්කරු ලෙස ගුණසේකර මහත්මිය කටයුතු කරයි. අධ්‍යයන පුස්තකාල ක්ෂේත්‍රයේ සැලකිය යුතු පුස්තකාල වෘත්තිකයින් සංඛ්‍යාවක් පුස්තකාල සංගමයේ සාමාජිකත්වය ලබා නොතිබීම දෙපාර්ශවයටම අයහපත් ලෙස බලපාන බැවින් ඒ තත්වයට පිළියම් යෙදීම පළමු ව්‍යාපෘතිය තෝරා ගැනීමට හේතුවූ බවත්, අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සාර්ථක පුස්තකාල හා තොරතුරු සේවාවකට අත්‍යාවශ්‍ය සාධකයක් වීම දෙවන ව්‍යාපෘතියට සම්බන්ධ වීමට බලපෑ හේතුව බවත් ඇය සඳහන් කළාය.



දැනට පුස්තකාලයාධිපතීන් වෙත යොමු කළ ප්‍රශ්නාවලියක් සහ වෙනත් මාර්ග ඔස්සේ අධ්‍යයන පුස්තකාල ක්ෂේත්‍රයෙන් පුස්තකාල සංගමයට බැඳී නොමැති පුස්තකාල වෘත්තිකයන් පිළිබඳ තොරතුරු රැස් කර ගෙන යන බවත් දෙවන ව්‍යාපෘතියට අදාළව මෙම ක්ෂේත්‍රයේ වෙනත් රටවල සිදු කරන ලද පර්යේෂණයන් සහ එම විෂය පිළිබඳ මෙරට පළවූ පර්යේෂණ ලිපි අධ්‍යයනය කරමින් සිටින බවද ඇය සඳහන් කරන ලදී. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ඉදිරි කටයුතුවලට උපායමාර්ගික සැලැස්ම ඉමහත් පිටිවහලක් බවත් ඉදිරියට ගමන් කිරීමේදී සිදුකළයුතු (උපායමාර්ගික) වෙනස්කම් පිළිබඳව එහි දක්වා ඇති බවත්, එබැවින් මෙම සැලැස්ම පිළිබඳව හොඳින් සිතා බලා, එය මනාව ක්‍රියාත්මක කරලීම සංගමයේ සාර්ථකත්වයට පාදක වන බවත් ගුණසේකර මහත්මිය සඳහන් කළාය.

## උපායමාර්ගික සැලැස්ම සෑම පුස්තකාල ක්ෂේත්‍රයකටම ඉහළ දායකත්වයක් ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකා පුස්තකාල සංගමය රටේ පුස්තකාල, පුස්තකාලයාධිපතිත්වය සහ පුස්තකාල වෘත්තිකයන්ගේ වෘත්තීය අවශ්‍යතා නියෝජනය කරන විද්වත් වෘත්තික සංවිධානය බැවින් මෙවැනි උපායමාර්ගික සැලසුම් මඟින් රජයේ පුස්තකාල ක්ෂේත්‍රය ඇතුළු සෑම පුස්තකාල ක්ෂේත්‍රයකටම ඉහළ දායකත්වයක් අපේක්ෂා කළ හැකි බව රජයේ පුස්තකාල කමිටුවේ (2016/2017) කැඳවුම්කරු සුමිත්‍රා මීගස්මුල්ල මෙනෙවිය සඳහන් කරයි.



උපායමාර්ගික සැලසුම යටතේ රාජ්‍ය අංශයේ පුස්තකාල සඳහා අත්පොතක් (manual) සම්පාදනය කිරීමේ ව්‍යාපෘතිය මෙම කමිටුව විසින් සිදු කරන ලද අතර දැනට එම කාර්යය අවසන් කොට අදාළ අත්පොත උපදේශක කමිටුව වෙත යොමු කර ඇත. රජයේ පුස්තකාලයාධිපතීන්ට තම වෘත්තීය සේවාවන් මනාව ඉටු කිරීමට මෙම අත්පොත උපකාරීවනු ඇතැයි ද ඒ මඟින් සමස්ත රාජ්‍ය පුස්තකාල සේවාව උසස් තත්වයකට ගෙන ඒමට හැකිවනු ඇතැයි ද මීගස්මුල්ල මෙනෙවිය විශ්වාසය පළ කරන ලදී.

*(Continued to page 08)*

*(Continued from page 07)*

## උපායමාර්ගික සැලැස්ම මගින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනාගතය සඳහා පුළුල් සහ පැහැදිලි වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර ඇත.

ශක්තිමත් ක්‍රියාශීලී සාමාජිකත්වයක් සිටීම ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනාගත සාර්ථකත්වයට අත්‍යාවශ්‍ය සාධකයක් බව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රලේඛන නිලධාරී, සංගමයේ සාමාජිකත්ව ප්‍රවර්ධන විශේෂ කමිටුවේ කැඳවුම්කරු ඉරෝමි විජේසුන්දර මහත්මිය පවසයි. දැනට පුස්තකාල විශාල ප්‍රමාණයකට විමසීම් ලිපි යවා කරන ලද සමීක්ෂණයක ප්‍රතිඵල ලෙස පුස්තකාල සංගමයට බැඳී නැති පුස්තකාල වෘත්තිකයන් සැලකිය යුතු ප්‍රමාණයක් හඳුනාගෙන ඇති බව ඇය සඳහන් කළාය.



මීට අමතරව පුස්තකාල සංගමය පිළිබඳ ප්‍රචාරක පෝස්ටරයක් ද නිර්මාණය කර ඇත. පුස්තකාල වෘත්තිකයින් සංගමයට ආකර්ශනය කර ගැනීම සඳහා දැනට පවතින සාමාජිකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය නවීකරණය කරලීම, සංගමයේ කටයුතු පුළුල් කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ සහ පුස්තකාලයාධිපතීන්ගේ යහපත සඳහා පැහැදිලි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි අංශ ගණනාවකින් කටයුතු කිරීම අවශ්‍ය බව විජේසුන්දර මහත්මිය සඳහන් කළාය. උපායමාර්ගික සැලැස්ම සංගමයේ අනාගතය සඳහා පුළුල්, පැහැදිලි වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර ඇති බැවින්, එය මනාව ක්‍රියාත්මක කරලීම මගින් රටේ සියලුම පුස්තකාල වෘත්තිකයින් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයට ආකර්ශණය කර ගැනීමට අවස්ථාව ලැබී ඇති බවද ඇය සඳහන් කළාය.

## නව පරපුරේ උනන්දුව අගය කළ යුතුයි.

නව පරපුරේ පුස්තකාල වෘත්තිකයින් පුස්තකාල හා විඥාපන විද්‍යා වෘත්තියේ ප්‍රගමනයට දක්වන උනන්දුව සතුටට කරුණක් බව සහ ඒ මගින් ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තියේ අනාගතය පිළිබඳ යහපත් අපේක්ෂා තබා ගත හැකි බව ජාතික පුස්තකාල කමිටුවේ සහ පුස්තකාල සංගමයේ තනතුරුවලට අදාළ කාර්යයන් හා වගකීම් හඳුනා ගැනීමේ විශේෂ කමිටුවේ කැඳවුම්කරු උපාලි අමරසිරි මහතා සඳහන් කරයි. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ශක්තිමත් කිරීම සඳහා වර්තමාන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා සුදුසු ප්‍රමිති හඳුන්වාදීම සහ ලොව ප්‍රධාන ජාතික පුස්තකාලවල විශිෂ්ට ව්‍යවහාර (Best practices) හඳුනා ගැනීම යන ව්‍යාපෘති උපායමාර්ගික සැලැස්ම යටතේ ජාතික පුස්තකාල කමිටුව දියත් කර ඇත.



බොහෝ අවස්ථාවල පුස්තකාල සංගමයේ ඉහළ තනතුරු දරන අය සංගමයේ කටයුතු සඳහා විශාල වෙහෙසක් දැරුවද, අනෙකුත් තනතුරු දරන්නන් ගෙන් සංගමයට සිදුවන සේවය අල්පවීම ගැටලුවක් වී ඇත. එසේම ප්‍රධාන තනතුරු දරන නිලධාරීන් වෙතින් ද ඇතැම් අංශවලින් අපේක්ෂිත සම්පූර්ණ වගකීම් හා කාර්යයන් ඉටු නොවන බව පෙනේ. මෙයට හේතුව සංගමයේ ඒ ඒ තනතුරුවල වගකීම් හා කාර්යභාරයන් පැහැදිලිව හඳුනා ගෙන නොතිබීම බවද තම කමිටුවේ අපේක්ෂාව ඒ සඳහා පිළියම් යෙදීම බව ද අමරසිරි මහතා සඳහන් කළේය. ඒ අනුව පුස්තකාල සංගමයේ සභාපති, පත්වීමට නියමිත සභාපති සහ ලේකම් යන තනතුරුවල වගකීම් හා කාර්යභාරය සකස් කොට පාලක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. අනෙක් ප්‍රධාන තනතුරු හා විද්වත් කමිටුවලට අදාළ කාර්යයන් හා වගකීම් බොහෝ දුරට හඳුනාගෙන ඇත. පුස්තකාල සංගමයේ උපායමාර්ගික සැලැස්මට සංගමයේ සාමජිකත්වයෙන් ලැබී ඇති ප්‍රතිචාර යහපත් බවත්, විශේෂයෙන්ම වෘත්තියේ අනාගතය භාර නව පරපුරේ පුස්තකාල වෘත්තිකයින් උපායමාර්ගික සැලැස්ම පිළිබඳවත්, එය ක්‍රියාත්මක කර ලීමට දක්වන උනන්දුවත් අගය කළ යුතු බවත් ඒ මහතා සඳහන් කළේය. උපායමාර්ගික සැලැසුම් වර්තමාන ලෝකයේ ලොකු කුඩා සෑම සංවිධානයකම අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව ඇති බවත්, සෑම අංශයක්ම ආවරණය කෙරෙන, සියලු දෙනාටම සම්බන්ධ විය හැකි යහපත් උපායමාර්ගික සැලසුම් මගින් දුර්වල ආයතන හා සංවිධාන, විශිෂ්ට, ශක්තිමත් ආයතන හා සංවිධාන බවට පත් කර ගත හැකි බවත් ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

**PUBLICATION COMMITTEE**

Mrs. Neetha Peiris – **Convener**
Dr. (Ms.) Champa Alahakoon
Mrs. Dilmani Warnasuriya
Mrs. Padma Bandaranayake
Mrs. Thushari Seneviratne
Mr. Subramanian Navaneethakrishnan

If undelivered please return to :

Sri Lanka Library Association
OPA Centre
Stanley Wijesundara Mawatha
Colombo 07
Sri Lanka

To :